# දේශපාලන අසහනකාරයෝ



**ජගත් ජේ එදිරිසිංහ**

තමන්ගේ පාණ්ඩිත්‍යයත් සදාචාරවාදී ගුණයත් ලෝකයට පෙන්වා දීමට මොකක් හෝ කුණු බාල්දියකට අත දැමීම නිල් කොළ රතු සියලු දේශපාලනඥයන්ගේ පුරුද්දයි. මේ එවන් අලුත්ම නා ගැනීමකි. මේ නා ගැනීම් කෙළවර වන පාටක් නම් නැත.

මොකක්දෝ චිත්‍රපටයක ප්‍රචාරක පුවරුවේ නිළියකගේ පිට පැත්ත පේනවා යයි කියා එය ඉවත් කරන්නට නියෝග කළ ඇමතියකු ලිපිබඳ කතාවක් මේ දවස්වල ෆේස්බුකියේ කරකැවෙයි. ශ්‍රී ලංකාව මේ ගමන් කරමින් තිබෙන්නේ තවත් තලේබාන් දේශයක් දෙසට නොවේදැයි සිතෙන්නේ මේවා අහන විට ය.

නිළියකගේ නිරුවත් පිට ප්‍රදර්ශක පුවරුවක අප දැක ගත් පළමු අවස්ථාව මෙය නොවේ. 1982 දී තිරගත වූ සුනිල් ආරියරත්න ගේ "බඹර ගීතය" චිත්‍රපටයේ රඟපෑ අපේ නිලි රැජින මාලිනී ෆොන්සේ-කා ගේ නිරුවත් පිට සහිත දැවැන්ත කටවුට් රට පුරා ප්‍රදර්ශනය කළ බවත් එයින් කාටවත් කිසිදු හානියක් නොවූ බවත් නොදන්නේ කවුද? චන්ද්‍රරත්න මාපිටිගමගේ "බඹරු නොදුටු මල්" චිත්‍රපටයේ ප්‍රධාන නිලියගේ උඩුකය නිරුවත් රුවක් දැක්වෙන කටවුට් එකක් මහරගම නැෂනල් සිනමා හල ඉදිරියේ ප්‍රදර්ශනය වූ බව අමතක කරන්නෙ කෙසේ ද? මේ කිසිදු පුවරුවක් නිසා කාටවත් මොකක් හෝ වුණා බවක් හෝ මාර්ග අනතුරු වැඩි වූ බවක් හෝ අපි කිසිදා නෑසුවෙමු.

එසේනම් මේ සිදුවෙමින් පවතින්නේ කුමක්ද? පැහැදිලිවම මේ සිදුවෙන්නේ අන්තවාදී අදහස් දරන කීපදෙනෙකුගේ උවමනාකම් අනුව නැටවෙන දෙශපාලන නාඩගම් පමණකි. මේ අන්තවාදයට තව තවත් යට වෙමින් රට ආගමික තලේබාන් දේශයක් කරා ගෙනයනවාද යන්න තීරණය කිරීම රටවැසියන් සතු කාර්යයකි.

ශෘංගාරාත්මක කලා නිර්මාණ දෙස කලාත්මක ඇසින් බලන්නට සමාජය පොළඹවනවා විනා ඒවා දෙස ජාගර ඇසින් අශ්ලීල ඇසින් බලන්නට පොළඹවන මේ ප්‍රවණතාව විනාශකාරී එකකි. වැඩි කල් නොගොස්ම මේ අන්තවාදීන්ට අනුව නැටවෙන දේශපාලන පඹයන් සීගිරි ලලනාවන්ටත් උඩුකය ඇඳුම් අන්දවනවා නිසැක ය.




